මෙම ඉල්ලුම් පත්‍රය නොමිලේ නිකුත් කෙරේ/ இவ்விண்ணப்பப் பத்திரம் இலவசமாக விநியோகிக்கப்படும் / THIS APPLICATION IS ISSUED FREE OF CHARGE

Remove Watermark Now

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
குடிவரவு, குடியகல்வுத் திணைக்களம்
DEPARTMENT OF IMMIGRATION AND EMIGRATION

විදේශයකදී ශ්‍රී ලාංකේය අනන්‍යතාව
வெளிநாட்டில் இலங்கையரின் அடையாளம்
SRI LANKAN IDENTITY OVERSEAS

SRI LANKA IMMIGRATION AND EMIGRATION

ආකෘතිය / படிவம் / Form } K

ආ. වි. ක. ක. / I. E. } 35 A

ශ්‍රී ලංකා ගමන් බලපත්‍රයක්, හදිසි/හඳුනාගැනීමේ සහතිකයක් සඳහා ඉල්ලුම්පත්‍රය
இலங்கை கடவுச்சீட்டு, அவசர/அடையாளச் சான்றிதழ் விண்ணப்பம்
APPLICATION FOR A SRI LANKAN PASSPORT, EMERGENCY/ IDENTITY CERTIFICATE

පරිගණකයට දත්ත සහ තොරතුරු ඇතුළත් කළ හැක්කේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් බැවින් **අයැදුම්පත ඉංග්‍රීසියෙන් පමණක් පිරවිය යුතුය**. වැඩි විස්තර සඳහා උපදෙස් පත්‍රිකාව බලන්න.

கணனியானது ஆங்கில மொழியை மட்டுமே ஏற்றுக்கொள்வதால் **விண்ணப்ப படிவத்தை ஆங்கிலத்தில் மட்டுமே பூர்த்திசெய்தல் வேண்டும்** மேலதிக தகவல்களுக்கு அறிவுறுத்தல் படிவத்தைப் பார்க்கவும்.

The data and information are fed into the computer only in English language. Hence **the application must be filled in English.** Please read instructions sheet for further information.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා/ அலுவலக உபயோகத்திற்கு மாத்திரம்/ For Office use only		
APPLICATION NO.	ALLOCATED PASSPORT NO.	AC CODE
N		

1. Type of Service — Normal ☐ One Day ☐
2. Type of Travel Document — All Countries ☐ Middle East Countries ☐ Emergency Certificate ☐ Identity Certificate ☐
3. Present Travel Document No. (If any)
4. NMRP No. (If any)
5. National Identity Card No.
6. Surname
7. Names other than Surname
8. Permanent Address
   District
9. Date of Birth — Date Month Year
10. Birth Certificate — No. District
11. Place of Birth
12. Sex — Female ☐ Male ☐
13. Profession/ Occupation/ Job
14. Have you obtained Dual Citizenship in Sri Lanka? — Yes ☐ No ☐
    If Yes, Dual Citizenship No.
    (Please fill up fields 17 and 18 in the next page)
15. Mobile/ Phone No. (to be notified via SMS when passport is ready for collection)
16. E-mail Address

pdfelement

මොබිටෙල් වෙතින් අඩුම රෝමිං ගාස්තු
மொபிடெல் மூலம் ஆகக் குறைந்த ரோமிங் கட்டணங்களை அனுபவித்திடுங்கள்
Enjoy the best rates from Mobitel while you roam across the world
අමතන්න/ அழையுங்கள்/ Call : 1717
Sri Lanka Telecom Mobitel
We Care. Always.

Remove Watermark Now

Compulsory for Dual Citizenship Holders

17. Foreign Nationality

18. Foreign Passport No.

19. **If this application is for a child below the age of 16 years, following information must also be provided.**

Father / Guardian
National Identity Card No. / Present Travel Document No.

Mother / Guardian
National Identity Card No. / Present Travel Document No.

පහත දැක්වෙන කොටු දෙක තුළ කළු ඉරිවල නොගෑවෙන පරිදි ඔබේ අත්සන වෙන වෙනම තබන්න.
கீழே உள்ள இரண்டு கூடுகளுக்குள்ளும் தயவு செய்து உங்கள் கையொப்பத்தை இடவும், கையொப்பம் கூடுகளில் முட்டக் கூடாது.
Please place your signature inside both cages below. Signature should not touch the border.

20

21

22. අයදුම්කරුගේ ප්‍රකාශය/විණ්ණප්පතාරරින් உறுதியுரை / Declaration of the Applicant

මම ශ්‍රී ලාංකික පුරවැසියෙකු බවත් ම විසින් ඉහත සඳහන් කළ තොරතුරු හා මේ අයදුම්පතට අමුණා ඇති අනෙකුත් ලේඛන සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි. තවද, අසත්‍ය තොරතුරු සහ ලියකියවිලි ඉදිරිපත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව දනිමි.

நான் ஒரு இலங்கைப் பிரஜையெனவும், மேற்போந்த என்னால் வழங்கப்பட்டுள்ள தகவல்களும் இணைக்கப்பட்டுள்ள ஆவணங்களும் சரியானவையெனவும், உண்மையானவையெனவும் இத்தால் உறுதியுரைக்கின்றேன். தவறான / போலியான ஆவணங்களைச் சமர்ப்பிப்பது தண்டைக்குரிய குற்றமாகுமென்பதையும் நான் அறிவேன்.

I declare that I am a citizen of Sri Lanka and the above information furnished by me and the documents attached hereto are true and correct.
Also, I am aware of the fact that producing forged/falsified documents and information is a punishable offence.

parliament

.....
දිනය/திகதி /Date

.....
අයදුම්කරුගේ අත්සන/விண்ணப்பதாரியின் கையொப்பம்
Signature of the Applicant

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා/அலுவலக உபயோகத்திற்கு மாத்திரம்/For Office Use Only

Controller's Order	Minute Sheet Attached (If any)	PPT No:
	..... DC / AC Signature	PPT Lost: Yes/No
		Police Report / TTD / NMRP
		Dual Citizen: Yes / No
		BC No. & District:
		NIC / DL / Postal ID
		MC No. & District
Pending at Computer Division		F's PPT / NIC Copy & Concent Letter
		M's PPT / NIC Copy & Concent Letter
		DC / AC's Order:

කොළඹ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මොබිටෙල් විශේෂ ශාඛාව වෙත පැමිණෙන්න.
கொழும்பு குடிவரவு, குடியகல்வுத் திணைக்களத்திலுள்ள மொபிடெல் இன் விசேட கிளைக்கு விஜயஞ்செய்யுங்கள்
Sri Lanka Telecom

Remove Watermark Now

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
විදේශයකදී ශ්‍රී ලාංකේය අනන්‍යතාව

ගමන් බලපත් අයැදුම් කරන්නන් සඳහා උපදෙස්
(මෙය අයැදුම්පත්‍රය සමඟ නොමිලේ නිකුත් කෙරේ)

SRI LANKA
IMMIGRATION AND EMIGRATION

(කරුණාකර අයැදුම්පත පිරවීමට පෙර සියලු උපදෙස් කියවන්න.)

(අ) අයැදුම්පත්‍ර (ආ. වි. 35 'කේ') සම්පූර්ණ කිරීමට උපදෙස් :

(1) ඔබ ගමන් ලියවිල්ල ලබා ගැනීමට බලාපොරොත්තු වන්නේ සාමාන්‍ය සේවය යටතේ ද, එක්දින සේවය යටතේ ද යන්න සඳහන් කරන්න.

(2) අවශ්‍ය ගමන් ලියවිල්ලේ වර්ගය - (i) සියලුම රටවල් සඳහා ද (ii) මැදපෙරදිග ඇතුළු නිශ්චිත රටවල් ඉන්දියාව, නේපාලය, බංග්ලාදේශය, පකිස්තානය, මාලදිවයින් සමූහාණ්ඩුව, ඉරානය, ඉරාකය, ලෙබනනය, සිරියාව, ජෝර්දානය, සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕමානය, කුවේටය, කටාර්, බහරේන් සහ යේමනය යන රටවල් සඳහා ද, (iii) හඳිසි සහතික ඉන්දියාව සහ නේපාලය සඳහා ද (iv) හඳුනාගැනීමේ සහතික - සියලුම රටවලට හෝ නිශ්චිත රටකට වලංගුකොට නිකුත් කෙරේ. (අදාළ කොටුව තුළ "√" සලකුණු කරන්න)

(3) අවසන් වරට ලබාගත් ගමන් ලියවිල්ලේ (ගමන් බලපත්‍ර/හඳිසි සහතිකය/හඳුනා ගැනීමේ සහතිකය) අංකය මෙහි ලියන්න. මෙරටදී එය නැති වූයේ නම්, පොලිසියට කරන ලද පැමිණිල්ලේ සහතික කළ පිටපතක් හෝ විදේශයකදී නැතිවූයේ නම් මෙරටට පැමිණීම සඳහා භාවිතා කරන ලද තාවකාලික ගමන් ලියවිල්ලේ ඡායාස්ථිති පිටපතක්ද සමඟ ඉදිරිපත් කළ යුතුය. (පළමු වරට අයදුම් කරන්නන්ට මෙය අදාළ නොවේ)

(4) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කළ ජාතික හැඳුනුම්පතේ අංකය ලියන්න. වයස අවුරුදු 16 ට වැඩි සෑම තැනැත්තෙක්ම තම ජාතික හැඳුනුම්පත එහි ඡායාස්ථිති පිටපතක්ද සමඟ ඉදිරිපත් කළ යුතුය.

(5) ඔබේ මුල් නම (වාසගම/පෙළපත් නම) එක් කොටුවක එක් අකුර බැගින් ලියන්න. නම් අතර එක් කොටුවක ඉඩක් හිස්ව තබන්න. *අයැදුම්කාරියක් විවාහයෙන් පසු ඇයගේ ස්වාමි පුරුෂයාගේ නම ඇතුළත් කොට ගමන් බලපත්‍රය අයැදුම් කරන්නේ නම් එම නාමය සඳහන් කරන්න. (මෙහිදී විවාහ සහතිකයේ මුල් පිටපත ඡායාස්ථිති පිටපතක්ද සමඟ ඉදිරිපත් කළ යුතුය.)

(6) අංක 04 යටතේ කොටුවල ලියූ ඔබේ මුල් නම/වාසගම හැර ඔබේ සම්පූර්ණ නමේ ඉතිරිය මෙම කොටුවල ලියන්න.

(7) ඔබේ ශ්‍රී ලංකාව තුළ ස්ථිර ලිපිනය මෙහි ලියන්න.

(8) පදිංචි ස්ථානය අයත් දිස්ත්‍රික්කය මෙහි සඳහන් කළ යුතුය.

(9) උපන් දිනය (උප්පැන්න සහතිකයට අනුව)

(10) උප්පැන්න සහතිකයේ අංකය හා දිස්ත්‍රික්කය (උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඡායාස්ථිති පිටපතක් ද සමඟ ඉදිරිපත් කළ යුතුය).

(11) උපන් ස්ථානය, උප්පැන්න සහතිකයේ දැක්වෙන පරිදි සඳහන් කරන්න.

(12) අදාළ කොටුව තුළ "√" සලකුණු කරන්න.

(13) ඔබේ උස සෙන්ටිමීටර්වලින් සඳහන් කරන්න (අඩි 1 = සෙන්ටිමීටර් 30.4 කි. අඟල් 1 = සෙන්ටිමීටර් 2.54 කි.)

(14) අදාළ කොටුව තුළ "√" සලකුණු කරන්න.

(15) ඔබේ රැකියාව/වෘත්තිය/තරාතිරම හෝ තනතුර මෙහි ලියන්න. වචන අතර එක් කොටුවක ඉඩක් හිස්ව තබන්න.(රැකියාව සනාථ කිරීමට අවශ්‍ය අධ්‍යාපන සහතික/වෘත්තීය සහතික/වෘත්තිය සනාථ කිරීමේ සහතිකවල මුල් පිටපත් ඡායාස්ථිති පිටපත්ද සමඟ ඉදිරිපත් කළ යුතුය)

(16) ඔබගේ ගමන් බලපත්‍රයට ඇතුළත් කරනු ලබන දරුවන් ගණන ලියන්න.

(17) ඔබ විදේශ රටක පුරවැසිභාවය හෝ ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය හෝ ලබාගෙන ඇත්නම් අදාළ කොටුවේ "√" සලකුණු කරන්න.
(ශ්‍රී ලංකා ද්විත්ව පුරවැසිභාවය ලබා ඇත්නම් එම සහතිකය ඡායාස්ථිති පිටපතක් ද සමඟ ඉදිරිපත් කරන්න.)

(18) ඔබව සම්බන්ධ කළ හැකි ජංගම දුරකථන අංකය සඳහන් කරන්න.

(19) ඔබගේ ඊමේල් ලිපිනය සඳහන් කරන්න.

(20, 21) ඡායාරූපය

(i) සෙන්ටිමීටර් 3.5 x 4.5 ප්‍රමාණයෙන් මෑතකදී ගත් වර්ණ ඡායාරූප 3 ක් ඉදිරිපත් කළ යුතුය. ඉන් එක් ඡායාරූපයක් මුල් පිටුවේ ඡායාරූපය සඳහා වෙන්කර ඇති කොටුවේද, අනෙක් ඡායාරූප දෙක අංක 20 හා 21 ලෙස සඳහන් කර ඇති කොටුවලද ඉතා පැහැදිලි ආකාරයට ඇලවිය යුතුය. අංක 21 කොටුවේ අලවන ඡායාරූපය මෙහි (උ) හි සඳහන් අයෙකු විසින් අත්සන හා මුද්‍රාව තබා සහතික කළ යුතුය.

(ii) මෙම ඡායාරූප දිලිසෙන හෝ අඩ දිලිසෙන ඡායාරූප නොවිය යුතුය.

(iii) ඡායාරූපයේ මුහුණ සෘජුව තිබිය යුතු අතර, කන් දෙකම දෘශ්‍යමාන විය යුතුය.(කන් වසාගත් ඡායාරූප ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

(iv) ඡායාරූප ඉහළ ප්‍රමිතියෙන් යුතු කඩදාසියක තීන්ත සලකුණු සහ තිත් නොමැතිව පැහැදිලිව මුද්‍රණය කර තිබිය යුතුය.

(v) මුහුණේ ඉරියව් වෙනස් නොකොට ඡායාරූපය තිබිය යුතුය.

(vi) ඇස් කණ්ණාඩි පැළඳ ඡායාරූප නොගත යුතුය.

(22, 23) ඔබගේ අත්සන අංක 22 කොටුව තුළත් අංක 23 කොටුව තුළත් ඒවායේ ඉරිවල නොගෑවෙන පරිදි තබන්න.

(24) අයැදුම්කරුගේ ප්‍රකාශය කියවා සම්පූර්ණ කොට අත්සන තැබිය යුතුය.

(25) අයැදුම්කරු/කාරිය පිළිබඳව සහ ඔහුගේ/ඇයගේ ඡායාරූපය පිළිබඳව වූ ප්‍රකාශය සම්පූර්ණ කර පහත (උ) හි සඳහන් අයෙකු විසින් අත්සන හා මුද්‍රා තබා සහතික කළ යුතුය.

(ආ) ගමන් බලපත්‍රයක් ලබා ගැනීමේදී අවශ්‍ය ලියවිලි :

(i) අයැදුම්කරුගේ/කාරියගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපතක් එහි ඡායාස්ථිති පිටපතක් සමඟ, උප්පැන්න සහතිකය නොමැති විටක දරුවකුගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපතක් එහි ඡායාස්ථිති පිටපතක් සමඟ/අනුමාන වයස් සහතිකය/උප්පැන්න සෙවීම පිළිබඳ හිස් ප්‍රතිඵල ලේඛනය.

(ii) ජාතික හැඳුනුම්පත එහි ඡායාස්ථිති පිටපතක් සමඟ.

(*) වැදගත් :

ගමන් බලපත්‍රය ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන අයැදුම් පත්‍රය හා ඒ සමඟ අමුණා ඉදිරිපත් කරන ලේඛන ගමන් බලපත්‍රය සමඟ අයැදුම්කරුට/කාරියට නැවත ලබා දෙනු ලබන අතර එම ලේඛන වසර 10 ක කාලයක් ඉක්ම යන තුරු (ගමන් බලපත්‍රය වලංගු කාල සීමාව ඉක්ම යන තුරු) ඉතා සුරක්ෂිතව අයැදුම්කරු/කාරිය විසින් තබා ගත යුතුය.

(ඇ) දෙමාපියන්ගේ ගමන් බලපත්‍රවලට දරුවන් ඇතුළත් කිරීම සඳහා අදාළ තොරතුරු හා උපදෙස් :

(i) ඒ සඳහා ආ. වි. 35 'සී' ආකෘති පත්‍රය මහින් ඉල්ලුම් කළ යුතුය.

(ii) දරුවන්ගේ නම්, ඔවුන්ගේ දෙමව්පියන්ගේ ගමන් බලපත්‍රවලට ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඔවුන්ගේ වයස අවුරුදු 16 ට අඩු විය යුතුය.

(iii) ජීවත්ව සිටී නම් දරුවාගේ මව සහ පියා යන දෙදෙනාම පැමිණිය යුතුයි.

(iv) දෙමාපියන්ගේ ගමන් බලපත්‍රවලට දරුවන්ගේ නම් ඇතුළත් කිරීමේ දී පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතු අතර, ඒවා ගමන් බලපත්‍රය සමඟ ආපසු එවනු ඇත./ලබා දෙනු ඇත.

(අ) නම් ඇතුළත් කරනු ලබන දරුවාගේ/දරුවන්ගේ උප්පැන්න සහතික ඒවායේ ඡායාස්ථිති පිටපත්ද සමඟ.

(ආ) ඉල්ලුම්කරුගේ ගමන් බලපත්‍රයට දරුවා/දරුවන් ඇතුළත් කිරීම සඳහා කලත්‍රයාගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය. කලත්‍රයා විදේශගත වී සිටී නම් එම ලිපිය අදාළ තානාපති කාර්යාලයේ නිර්දේශය සහිතව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වේ. විදේශ තානාපති කාර්යාල නොමැති රටවල් සඳහා පත් කර ඇති කොන්සාල්වරයාගේ අනු අත්සන සහිතව ඉදිරිපත් කළ යුතුය.

20 වසර
පුංචි පුංචි වැදගත් දේ කියන්න
ශ්‍රී ලංකාවේ තත්පරයට අයකරන අඩුම IDD ගාස්තු
Sri Lanka Telecom
Mobitel

(ඇ) කලත්‍රයාගේ ගමන් බලපත්‍රයේ දත්ත පිටුව හා දරුවන් ඇතුළත් පිටුව (කලත්‍රයා විසින් ගමන් බලපත්‍රයක් ලබාගෙන නොමැති නම්, ඒ බව සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් හා කලත්‍රයාගේ ජාතික හැඳුනුම්පත ජායාස්ථිති පිටපතක් ද සමඟ).

(ඈ) කලත්‍රයා මියගොස් ඇත්නම් ඔහුගේ හෝ ඇයගේ මරණ සහතිකය.

(ඉ) දික්කසාද වී ඇත්නම් දික්කසාදය පිළිබඳ උසාවි නියෝගය හෝ අදාළ සහතික ඉදිරිපත් කළ යුතුය.

(v) දරුවන්ගේ නම් ගමන් බලපත්‍රයට ඇතුළත් කිරීමේ දී අදාළ දරුවාගේ වර්ණ ජායාරූප 02ක් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. එම ජායාරූප සෙන්ටිමීටර් 2.5 × 3 ප්‍රමාණයේ විය යුතුය. දරුවන්ගේ ජායාරූප ආකෘතිපත්‍රයේ අලවා, දකුණු පස ජායාරූපය මෙහි අංක (උ) හි සඳහන් කවර හෝ නිලධාරියෙක් විසින් සහතික කළ යුතුය.

(vi) ගමන් බලපත්‍රයක් ලබා ගැනීමේදී එම අවස්ථාවේදීම දරුවන්ගේ නම් ඊට ඇතුළත් කරන්නේ නම්, ඒ සඳහා අතිරේක ගාස්තුවක් අය නොකෙරේ.

(ඈ) අවුරුදු 16ට අඩු දරුවන් සඳහා වෙනම ගමන් බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන :

(i) ආ. වී. 35 'කේ' ආකෘතිපත්‍රය.

(ii) උප්පැන්න සහතිකයේ මුල් පිටපත ජායාස්ථිති පිටපතක් සමඟ (ඉංග්‍රීසි පරිවර්තන උප්පැන්න සහතිකයේ මුල් පිටපත ලෙස නොසැලකේ.)

(iii) දෙමාපියන්ගේ ගමන් බලපත්‍රවල දත්ත පිටුවේ ජායාස්ථිති පිටපතක් සහ ළමයින්ගේ ජායාරූප පිටුවේ (පිටු අංක 6) ජායාස්ථිති පිටපතක් සමඟ අදාළ ගමන් බලපත්‍රය.

(iv) දෙමාපියන් ගමන් බලපත්‍ර ලබාගෙන නොමැති නම්, ඒ බවට දිවුරුම් ප්‍රකාශයක් හා දෙමාපියන්ගේ ජාතික හැඳුනුම්පත් සමඟ ඒවායේ ජායාස්ථිති පිටපත්.

(v) දරුවන්ට වෙනම ම ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම පිළිබඳ දෙමාපියන්ගේ කැමැත්ත ප්‍රකාශිත ලිපි. (මව හෝ පියාගෙන් එක් අයෙක් හෝ දෙදෙනාම විදේශගතව සිටී නම්, ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය ෆැක්ස් මඟින් ගෙන්වා ඉදිරිපත් කළ යුතුය.)

(vi) මව හෝ පියා හෝ මියගොස් ඇත්නම්, අදාළ මරණ සහතිකය ජායාස්ථිති පිටපතක් ද සමඟ.

(vii) දෙමාපියන් දික්කසාද වී ඇත්නම්, දික්කසාද සහතිකය ජායාස්ථිති පිටපතක් ද සමඟ.

(viii) දරුවාට වෙනම ගමන් බලපත්‍රයක් ලබාගැනීමට පෙර, එම දරුවන් තම මවගේ හෝ පියාගේ වලංගු ගමන් බලපත්‍රයට ඇතුළත් කර තිබේ නම්, එය ප්‍රථමයෙන් ඉවත් කළ යුතු වන අතර, ඒ සඳහා ආ. වී. 35 "සී" පෝරමය පුරවා රු.500.00ක ගාස්තුවක් සමඟ ඉදිරිපත් කළ යුතුය. (මෙම ගාස්තු සංශෝධනයට යටත් වේ)

(ix) සෙන්ටිමීටර් 3.5 × 4.5 ප්‍රමාණයේ ජායාරූප 3ක් ඉදිරිපත් කළ යුතුය.

(x) දරුවන් විදේශයක උපත ලබා සිටී නම්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව නිකුත් කළ ශ්‍රී ලංකාවේ පුරවැසි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

(ඉ) ගමන් බලපත්‍ර ලබාගැනීමේ දී පහත සඳහන් වැරදි කිරීම් 1955 අංක 16, 1961 අංක 68, 1993 අංක 16, 1998 අංක 42 සහ 2001 අංක 31 දරන පනත්වලින් සංශෝධිත 1948 අංක 20 දරන පනතට අනුව දඬුවම් ලැබිය හැකි වරදකි :

(i) අසත්‍ය තොරතුරු සැපයීම

(ii) කූඨ ලෙස තැනූ හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම

(iii) වලංගු ගමන් බලපත්‍රයක් ළඟ තබාගෙන, තවත් ගමන් බලපත්‍රයක් ඉල්ලුම් කිරීම

(iv) වෙනත් අයගේ ගමන් බලපත්‍ර පරිහරණය කිරීම

(v) ලබාගත් ගමන් බලපත් ව්‍යාජ ලෙස වෙනස් කිරීම

(vi) වෙනත් අයගේ ලේඛන ඉදිරිපත් කොට, ගමන් බලපත්‍ර ලබාගැනීම

(ඊ) ගමන් බලපත්‍රයක් නැති වූ අවස්ථාවක පහත සඳහන් දෑ ඉදිරිපත් කළ යුතුය :

(i) ගමන් බලපත්‍රය නැති වූ බවට පොලිසියේ කරන ලද පැමිණිල්ලේ මුල් පිටපත.

(ii) ගමන් බලපත්‍රය පිටරටකදී නැති වූයේ නම්, එම රටේ සිට ශ්‍රී ලංකාවට පැමිණි තාවකාලික ගමන් ලියවිල්ල. (ජායාස්ථිති පිටපතක් ද සමඟ)

(iii) ගමන් බලපත්‍ර ගාස්තුවට අමතරව, රු.10,000.00 ක (රුපියල් දස දහසක) දඩ මුදලක්. (මෙම දඩ මුදල අයකරනු ලබන්නේ නැති වූ ගමන් බලපත්‍රයේ වසර 10ක වලංගු කාලය ඉක්ම වී නොමැති නම් පමණි.)

(උ) ගමන් බලපත්‍ර අයදුම්පත සහතික කළ හැකි අය :

(i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, අධ්‍යාපන පරිපාලන සේවයේ, ගණකාධිකාරී සේවයේ, ක්‍රම සම්පාදන සේවයේ හෝ ඉංජිනේරු සේවයේ නිලධාරියෙක්

(ii) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරියෙක්

(iii) නීතිඥයෙක්

(iv) සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියෙක්

(v) යුධ, නාවික, ගුවන් හමුදා හෝ පොලීසියේ අධිකාරිලත් නිලධාරියෙක්

(vi) තම ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ පොලිස් පරීක්ෂක (ස්ථාන භාර නිලධාරී)

(vii) තම ප්‍රදේශයේ සමෘද්ධි කළමනාකරු/ග්‍රාම නිලධාරී/සමාජ සේවා නිලධාරී

(viii) තැපැල් ස්ථානාධිපතිවරයෙක්/රජයේ පාසලක විදුහල්පතිවරයෙක්/කම්කරු නිලධාරියෙක්

(ix) වතු අධිකාරිවරයෙක්

(x) සාමදාන විනිශ්චයකාරයෙක්

(ඌ) ගාස්තු :

		වයස අවු.16ට අඩු ළමුන් සඳහා වසර 3ක කාලයකට	
වැඩ දින සේවය	සාමාන්‍ය සේවය	වැඩ දින සේවය	සාමාන්‍ය සේවය
රු.7,500.00	රු.2,500.00	රු.3,500.00	රු.1,500.00
රු.2,500.00	රු.1,000.00	රු.1,500.00	රු.1,000.00
–	රු.500.00	–	–
රු.2,500.00	–	–	–

(i) සියලුම රටවල් සඳහා ගමන් බලපත්‍රය ... ...

(ii) මැද පෙරදිග ඇතුළු නිශ්චිත රටවල් සඳහා ගමන් බලපත්‍රය ... ...

(iii) ඉන්දියාව සහ නේපාලය සඳහා හදිසි සහතිකය ... ...

(iv) සියලුම රටවල් සඳහා හදිසි සහතිකය ... ...
(ශ්‍රී ලංකා රජයේ තීරණ මත සියලුම ගාස්තු සංශෝධනය විය හැක)

(එ) භික්ෂූන් වහන්සේලා සඳහා ගමන් බලපත්‍ර ඉල්ලුම් කිරීම :

(i) උප්පැන්න සහතිකයේ මුල් පිටපත සහ ජාතික හැඳුනුම්පත ජායාස්ථිති පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය.

(ii) භික්ෂු සාමණේර සහතිකය හෝ උපසම්පදා සහතිකය ද ජායාස්ථිති පිටපත් සමඟ ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(ඒ) රාජකාරී සහ රාජතාන්ත්‍රික ගමන් බලපත්‍රවලට දරුවන් ඇතුළත් නොකෙරේ.

*** අයදුම්පත්‍ර භාර ගැනීම.**

චක්දින සේවය : පෙ.ව. 8.00 - ප.ව. 1.30 දක්වා

සාමාන්‍ය සේවය : පෙ.ව. 8.30 - ප.ව. 2.00 දක්වා

Digiscan Printing

20

කොළඹ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මොබිටෙල් විශේෂ ශාඛාව වෙත පැමිණෙන්න.

Sri Lanka Telecom Mobitel